කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010
2011 අප්‍රේල් / මැයි

**සමාජීය විද්‍යා පීඨය**

**පුස්තකාල හා විඥාපන විද්‍යාව - LISC - E 1025**

**පුස්තකාල, ඒවායේ සේවා, එකතු සංවර්ධනය හා කළමනාකරණය**

**<u>ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සංවර්ධිත ලෝකයේ මෙන්ම ඇතැම් සංවර්ධනය වෙමින් පවත්නා රටවලද පුස්තකාල ව්‍යාපාරයේ ප්‍රධාන තේමාව වී ඇත්තේ සහයෝගිතාවයයි. ඔබ කැමති ජාතික පුත්කාලයක් ඇසුරින් මෙම කියමන පිළිබඳව සාකච්ඡා කරන්න.

02. විශේෂ පුස්තකාලයක් යනු කුමක් දැයි නිර්වචනය කර රටක සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කරලීමේ කාර්යයේදී විශේෂ පුස්තකාල මගින් පවත්වාගෙන යනු ලබන තොරතුරු සේවාවන් හි කාර්යභාරය පිළිබඳව විමසීමක් කරන්න.

03. පුස්තකාල ඉතිහාසය විමර්ශනය කිරීමේදී පැහැදිලිව පෙනී යන කරුණක් වන්නේ පුස්තකාලයන්හි පැවැත්මට ප්‍රබලම තර්ජනය එල්ල කර ඇති සත්වයා මනුෂ්‍යයා බවයි. ජාතික හා ජාත්‍යන්තර නිදසුන් ඇසුරින් මෙය සනාථ කරන්න.

04. විධිමත් පුස්තකාල සේවාවක් පවත්වාගෙන යාමේ කාර්ය උදෙසා පුස්තකාල ප්‍රමිතිවලින් ලැබෙන පිටිවහල සාකච්ඡා කරන්න.

05. පුස්තකාලයන්හි පොත් තේරීමේ කාර්යයේ දී සාම්ප්‍රදායික ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍ර අභිබවමින් විද්‍යුත් මූලාශ්‍ර පෙරමුණ ගෙන ඇත. නිදසුන් ඇසුරින් මෙම කියමන සාකච්ඡා කරන්න.

06. පුස්තකාල තොග සත්‍යාපනය යනු කුමක්දැයි හඳුන්වා එතුලින් ලැබෙන වාසි පිළිබඳව විමසීමක් කරන්න.

07. පහත සඳහන් මාතෘකා **<u>හතරක් (04)</u>** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    i. නෙවාක් ග්‍රන්ථ සංසරන ක්‍රමය
    ii. BNB
    iii. S.R. රංගනාදන්
    iv. ඇනවුම් ගොමුව
    v. ප්‍රලේඛන මධ්‍යස්ථාන

*************************